# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## ඇබෑර්තු

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකිකයන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය:

### 1. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (JM 1-1) – තනතුරු 01

**"සුදුසුකම්"**

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් උපාධියක් සහ උපාධි සුදුසුකම ලැබීමෙන් පසු වසරක පළපුරුද්ද.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක අන්තර්මධ්‍යම පරීක්ෂණය සමත්වී තිබීම සහ සුදුසුකම් ලැබීමෙන් පසු වසරක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ 'ආශ්‍රිත නිලධාරි' (MA3) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ 'කළමනාකරණ සහකාර-තාක්ෂණික නොවන' (MA1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස:**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය**

JM 1-1 - 01/2025:රු. [72,650 - 10 X 1,360 - 18 X 2,040 = 122,970/-]

2027.01.01 දිනට මූලික වැටුප - රු. 72,650

### 2. මනෝසමාජීය නිලධාරී (JM 1-1) – තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් මනෝවිද්‍යාව / සමාජවිද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්.

   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත්, බලයලත් ආයතනයකින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමග පරිගණක සාක්ෂරතාවය සහ EXCEL සහ SPSS භාවිතයේ ප්‍රවීණතාවය අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ 'කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන' (MA 1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස:**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:**

JM 1-1 - 01/2025:රු. [72,650 - 10 X 1,360 - 18 X 2,040 = 122,970/-]

2027.01.01 දිනට මූලික වැටුප - රු. 72,650

### 3. විමර්ශන සහකාර (MA 3) – තනතුරු 02

**සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අපරාධ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්.

**වයස:**

අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය**

MA 3 - 01/2025:රු. [53,940 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 5 X 1,350 = 94,980/-] 2027.01.01 දිනට මූලික වැටුප - රු. 53,940

### 4. වැඩසටහන් සහකාර (MA 3) – තනතුරු 02

**සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සමාජවිද්‍යාව / සමාජීය විද්‍යා / සෞඛ්‍ය ප්‍රවර්ධනය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්. ළමුන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් වසරක ඩිප්ලෝමාවක් තිබීම විශේෂ සුදුසුකමකි.

**වයස:**

අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය**

MA 3 - 01/2025:රු. [53,940 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 5 X 1,350 = 94,980/-] 2027.01.01 දිනට මූලික වැටුප - රු. 53,940

### 5. අන්තර්ජාල ආවේක්ෂණ සහකාර (MA 3) – තනතුරු 01

**සුදුසුකම්:** (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක්.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් උපාධියක් සමග තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම

**වයස:**

අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය**

MA 3 - 01/2025:රු. [53,940 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 5 X 1,350 = 94,980/-] 2027.01.01 දිනට මූලික වැටුප - රු. 53,940

### 6. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී (MA 3) – තනතුරු 25

**සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සමාජීය විද්‍යා හෝ වෙනත් අදාළ උපාධියක්.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් උපදේශනය පිළිබඳ වසරක ඩිප්ලෝමාවක් තිබීම අමතර සුදුසුකමක් වේ.

**වයස:**

අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය**

MA 3 - 01/2025:රු. [53,940 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 5 X 1,350 = 94,980/-] 2027.01.01 දිනට මූලික වැටුප - රු. 53,940

### 7. සැලසුම් සහකාර (MA 3) – තනතුරු 01

**සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් කළමනාකරණය / සමාජීය විද්‍යා හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්.

**වයස:**

අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය**

MA 3 - 01/2025:රු. [53,940 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 5 X 1,350 = 94,980/-] 2027.01.01 දිනට මූලික වැටුප - රු. 53,940

### 8. රියදුරු (PL 3) – තනතුරු 02

**බාහිර අයදුම්කරුවන්:**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් වාර දෙකකට නොවැඩි ගණනකදී අඩුම තරමින් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

**සහ**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබීම (බර වාහන පැදවීම සඳහා නිකුත් කළ වලංගු බලපත්‍රයක්) සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රිය පැදවීමේ පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබීම (බර වාහන පැදවීම සඳහා නිකුත් කළ වලංගු බලපත්‍රයක්) සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක රිය පැදවීමේ පළපුරුද්ද.

**සහ**

ශිල්පීය නොවන (PL1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස:**

අවුරුදු 18 ට නොඅඩු සහ **අවුරුදු 45 ට** නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය**

PL 3 - 01/2025:රු. [43,280 - 10 X 490 - 10 X 540 - 10 X 590 - 12 X 630 = 67,040/-] 2027.01.01 දිනට මූලික වැටුප - රු. 43,280

**ඉහත සියලුම තනතුරු සඳහා:**

මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව හිමිවේ. සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා 3% ක් අධිකාරිය විසින් දරනු ලැබේ.

**ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය: (රියදුරු තනතුර හැර)**

පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

**රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය**

ප්‍රායෝගික පරීක්ෂණයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

**සාමාන්‍ය කොන්දේසි:**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු අතර, යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ආදර්ශ අයදුම්පත ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියෙන් (**www.childprotection.gov.lk**) බාගත කර ගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 අගෝස්තු 24 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත ලිපිනයට එවිය යුතුය.

උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍රය, මූලික සුදුසුකම් (අධ්‍යාපනික, වෘත්තිය සහ පළපුරුද්ද) සනාථ කිරීමේ සහතික/ලේඛනවල සහතික කළ පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක අයදුම්පත සමග එවිය යුතුය.

තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

කවරයේ ඉහළ වම් පස කෙළවරේ අයදුම් කරන තනතුර සහ විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන මාධ්‍යය (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි) සඳහන් කළ යුතුය.

රාජ්‍ය අංශයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අසම්පූර්ණ, නොපැහැදිලි අයදුම්පත් සහ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් වේ. කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගය සහ/හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,**
**නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.**
**දුරකථන අංකය : 0112778911-14**
**වෙබ් අඩවිය : www.childprotection.gov.lk**

tamilguru.lk